ශ්‍රී ලංකාවේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය
ஸ்ரீ லங்கா சமூக ஜனநாயகக் கட்சி
SOCIAL DEMOCRATIC PARTY OF SRI LANKA

2019.10.23

**රොහාන් පල්ලෙවත්ත මහතා විසින් මහේෂ් සේනානායක මහතා වෙත චෝදනා එල්ල කලා යැයි පැවසෙන පුවත සම්බන්ධයෙනි**

මහේෂ් සේනානායක මහතා යනු UNP බළල් අතක් බවට රොහාන් පල්ලෙවත්ත මහතා විසින් ප්‍රකාශ කල බව කියමින් මේ දිනයන්හී සංසරණය වන පුවතක් පිළිබඳව ඇතැම් පිරිස් අපගෙන් කරුණු විමසූ අතර, එය කිසිසේත්ම අප පක්ෂය විසින් හෝ රොහාන් පල්ලෙවත්ත මහතා විසින් සිදු කල ප්‍රකාශයක් නොවන බවටත්, අප තවමත් පෙනී සිටින්නේ සියළුම විකල්ප කණ්ඩායම් එක වේදිකාවක් මතට ගෙන ඒමින් රටෙහි අභිවෘද්ධිය සඳහා සහයෝගිව කටයුතු කිරීමටත් බව අවධාරණය කල යුතුය. අභිමන් ලංකා නමින් ආරම්භ කල සන්ධානයේද එකම අභිප්‍රාය වූයේ විකල්ප කණ්ඩායම් එකතු කරවීමයි.

අප පක්ෂයෙහි නිල ෆේස්බුක් පිටුවෙහි පල වුනා යැයි කියන කමෙන්ටුවක් සම්බන්ධයෙන් ඉහත සඳහන් කල පුවත පල කර ඇති අතර, ඒ පිළිබඳව අප වැඩිදුරටත් විමර්ෂණය කරන සිදු බවත්, එය කිසිසේත්ම අප පක්ෂයේ හෝ රොහාන් පල්ලෙවත්ත මහතා විසින් සිදු කරන ලද ප්‍රකාශයක් නොවන බවටත් ඉතාමත් කාරුණිකව නැවත අවධාරණය කරනු කැමැත්තෙමු.

ස්තූතියි!
විශ්වාසී,

ඩේවිඩ් බෙන්ජමින්
විද්‍යුත් මාධ්‍ය ලේකම්

Add: 678/4, Muttetugoda 2nd Ln, Thalangama North 10120, Battaramulla, Sri Lanka
Tel: 0757 737 737 | General Secretary : 075 334 5552
Email: info@sdpsl.lk | Web: www.sdpsl.lk